# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1824/2 - 2013 අගෝස්තු මස 19 වැනි සඳුදා - 2013.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් රජයට ගැනීම් පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය : 3/1/3/1.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : LD/05/2009/WS/187.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ, උනුවින්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2013.06.27 දිනැති අංක මහ 6275 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "මාගහයාය" නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0506ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| කැබලි අංක | - | 01 |
| ඉඩමේ නම | - | මාගහයාය |
| ප්‍රමාණය | - | හෙක්ටයාර් 0.0506 |

මායිම් :

*උතුරට* : මහනුවර රදගුරුතුමා හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය ;
*නැගෙනහිරට* : මහනුවර රදගුරුතුමා හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය සහ ඒ. එම්. ජයතිලක හිමිකම් කියන මාගහයාය ;
*දකුණට* : ඒ. එම්. ජයතිලක හිමිකම් කියන මාගහයාය සහ මහනුවර රදගුරුතුමා හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය ;
*බටහිරට* : මහනුවර රදගුරුතුමා හිමිකම් කියන ශාන්ත මරියා දේවස්ථාන භූමිය.


1A - G 18143 — 170 (2013/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් : 1. මහනුවර අති උතුම් රදගුරුතුමා,
අංක 873,
පේරාදෙණිය පාර,
මහනුවර.

2. ඒ. එම් ජයතිලක මහතා,
කන්දේහන්දිය,
උනුවින්න.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ. ව. 10.30ට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2013 ඔක්තෝබර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

මධුපානී පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට.

පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තලාතුඔය.

09-14

---

ශුද්ධි පත්‍රිකාවයි

ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4/3/8/2011/PC/308.
යොමු අංකය : කැප්‍රාලේ/අත්3/1/75.

2013 ජුනි මස 20 වැනි දිනැති අංක 1815/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ සඳහන්, කැබලි අංක 02හි ප්‍රමාණය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දී සිටිමි.

ප්‍රමාණය : හෙක්. 3.9102 ලෙසත් මෙයින් නිවේදනය කරමි.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කැස්බෑව.

2013 අගෝස්තු මස 15 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

09-15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.